**වඩමරාච්චි නිරිත ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

වඩමරාච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වඩමරාච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සහ 2018 වර්ෂයේ සභාව විසින් සංවර්ධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ රු. 3,432,039 ක ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම් ඒම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි. | සංවර්ධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති 02 ක් රු. 2,932,039 ක වටිනාකම 2022 වර්ෂයේ ජර්නල් සටහන් මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.<br>2018 වර්ෂයේ සංවර්ධන ප්‍රතිපාදන යොදවා රු. 500,000 ක් වැය කර ඉදිකරන ලද වදිරි පෙර පාසලේ මායිම් තාප්පයේ ඉදි කිරීම් වැඩවල වටිනාකම 2022 අවසන් ගිණුම්වල ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් භාණ්ඩ මිලදී ගෙන නොතිබුණු ව්‍යාපෘති 02 ක් සහ ක්‍රියාත්මක කර නොතිබුණ සංවර්ධන ව්‍යාපෘති 11 ක් අදාල ටෙන්ඩර් කැඳවීම් සහ ඇස්තමේන්තු මිලගණන් අනුව වවුචර් පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබීමෙන් වියදම් සහ ජංගම වගකීම් රු. 31,451,311 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | අදාල ව්‍යාපෘති 11 ක ගිවිසුම් ගත මුදල විවිධ ණය හිමියන් යටතේ ගිණුම්ගත කරන ලදි. වැඩ නිමවීමෙන් පසු ගෙවීම් කරනු ලැබේ. ප්‍රාදේශීය සභාවල වර්ෂ අවසානයේ ගෙවීම් කිරීම සඳහා එම මුදල විවිධ ණය හිමියන් යටතේ තබා ගැනීමේ ගිණුම් ක්‍රමය අනුගමන කරනු ලැබේ. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදල සඳහා 2022 වර්ෂයේ ගෙවීයුතු ණය මුදල රු. 1,550,564 ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීමක් වශයෙන් දැක්විය යුතු වුවද, ණය ප්‍රාග්ධනය යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් අඩුවෙන්ද ණය ප්‍රාග්ධනය වැඩියෙන්ද දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දේශිය ණය සංවර්ධන අරමුදලට 2022 වර්ෂයේ ගෙවිය යුතු රු. 1,550,564 ක් මාර්ග සංවර්ධන වැඩ සඳහා යොදා ගත් බැවින් එය ප්‍රාග්ධන වැයක් ලෙස 2022 වර්ෂයේ අයවැය මගින් මුදල් වෙන්කර ඇත. ණය ලබාගත් වර්ෂයේ සිට ප්‍රාග්ධන වැයක් වශයෙන් දක්වා ඇත. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | දේශීය ණය සංවර්ධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට සනාථ කරන ශේෂය, මූල්‍ය ප්‍රකාශයේ සඳහන් ශේෂයට වඩා රු. 268,030 ක් වැඩියෙන් දක්වා තිබීමෙන්, ණය ප්‍රාග්ධනය වැඩියෙන් දක්වා තිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය වන රු. 268,030 ක් 2007 වර්ෂයේ සිට ශේෂපත්‍රයේ බැරකමක් වශයෙන් දක්වමින් තිබුණි. මෙම මුදල් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලිපිගොනු සහ ලේඛනවලින් තොරතුරු ලබා ගත නොහැකිව ඇත. | අදාල කරුණු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර, සභාවේ කටයුතු සම්බන්ධයෙන් සාක්ෂි නිසි පරිදි පවත්වා ගෙන යාම සනාථ විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 67,899,056 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.54,377,128 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම්**<br>1987 හි අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) සහ බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලිවලින් අයකළ යුතු වරිපනම් බදු වර්ෂ 1 – 5 දක්වා අයකර ගතයුතු රු. 2,670,278 ක වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණ විය. තවද, හිඟ ආදායම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂනයන්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ලැයිස්තුගත වරිපනම් බදු ආදායම රු. 142,171 ක් වූවද, රු. 112,229 ක් අයකර ගෙන නොතිබුණි. | 1969 වර්යේදි පවත්වන ලද තක්සේරු අනුව වඩමරාච්චි නිරිත ප්‍රාදේශීය සභාවට අයත් දේපළ 12512 කි. එමගින් අයවිය යුතු වරිපනම් රු. 142,171 ක් වේ. ඒ අනුව අයවන වරිපනම් රු. 1 සිට රු. 10 ක් දක්වා වේ.<br>ඉදිරියේදි කාල විශ්ලේෂනය ඉදිරිපත් කරමි. කෝවිඩ් 19 හේතුවෙන් වරිපනම් ගෙවීම සඳහා පැමිණීම අඩුවී ඇත. | නව වරිපනම් තක්සේරුවක් සිදුකර වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල තැන්පත් කර ඇති රු. 275,748,864 ක මුදල යොදවා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර පොලි ඉපයීමේ අරමුණෙන් බැංකුවේ තැන්පත් කර ඇත. | ප්‍රාදේශීය සභාවේ පරණ පොල අසල වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා රු. මිලියන 328.7 ක් ඇස්තමේන්තුවක් සකස්කර අප වෙත එවා ඇත. ස්ථාවර තැන්පත් මුදල යොදවා ඉදි කිරීම ආරම්භ කිරීමට තීරණය කර ඇත. | සභා අරමුදල අරපිරිමැස්මෙන් උපරිම මට්ටමින් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීම සනාථ කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂයේ සේවය හැර ගිය, විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයකර ගත යුතුව තිබූ රු. 304,500 ක් වටිනා හිඟ ආපදා ණය සහ උත්සව අත්තිකාරම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන් 02 ක් සේවය හැර ගොස් ඇත. ණය ශේෂය අයකර ගැනීම සඳහා NP/09/A&P/04/12/CIR/2020 අංක දරණ පළාත් මුල්‍ය චක්‍රලේඛය අනුව කටයුතු කර ඇත. අනිකුත් දෙදෙනා විශ්‍රාම ගොස් ඇති බැවින් ඔවුන් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගත හැකි පරිදි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත PD3 ආකෘතිය යවා ඇත. | හිඟ සේවක ණය අදාල කාලයතුල අයකර ගැනීම සඳහා ආයතනය සංග්‍රහයේ විධිවිධානය අනුව කටයුතු සිදුකළ යුතුය. |